© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ජාතික අධ්‍යාපන ආයතනය**
**විභාග දෙපාර්තමේන්තුව**
**தேசிய கல்வி நிறுவகம்**
**பரீட்சைகள் துறை**
**NATIONAL INSTITUTE OF EDUCATION**
**DEPARTMENT OF EXAMINATIONS**

**අධ්‍යාපනවේදී (විශේෂ) උපාධිය (2017 - 2021)**
**කොටස I - 2020 (පෙරහුරු පරීක්ෂණය)**

**BH 0151** **පළමු බස (සිංහල)**
**FIRST LANGUAGE (SINHALA)**

**2020** **පැය 0900 - පැය 1200** **කාලය - පැ තුනයි.**

*උපදෙස්:-*

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- II කොටසෙන් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- I කොටසේ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණන්න.
- II කොටසේ සෑම පිළිතුරක් ම නව පිටුවකින් අරඹන්න.
- අත් අකුරු පැහැදිලි ව ලියන්න.

---

**ාභාග අංකය:-** ...............................

**I කොටස**

නිවැරදි පිළිතුරෙහි අංකය දී ඇති වරහන තුළ ලියන්න.

01. සිදත් සඟරා හෝඩියෙහි අක්ෂර සංඛ්‍යාව,
    1. තිහකි.  2. තිස් දෙකකි.
    3. හැටකි.  4. පනස් හතරකි. (................)

02. ච, ඡ, ජ, ඣ, ඤ මේ අකුරු හැඳින්වෙන්නේ,
    1. කණ්ඨජ වශයෙනි.  2. තාලුජ වශයෙනි.
    3. ඔෂ්ඨජ වශයෙනි.  4. මූර්ධජ වශයෙනි. (................)

03. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දක්වා ඇති පද පේළිය වන්නේ,
    1. ලේඛනය, භාෂණය, කථනය, උච්චාරණය
    2. උච්චාරණය, කථනය, භාෂණය, ලේඛනය
    3. භාෂණය, ලේඛනය, උච්චාරණය, කථනය
    4. උච්චාරණය, කථනය ලේඛනය, භාෂණය (................)

04. අක්ෂර වින්‍යාසය නිවැරදි ව දැක්වෙන පද පේළිය වන්නේ,

1. වර්ධනය, මර්ධනය, ගවේෂණය, සමීක්ෂණය
2. විශ්වාසනීය, සම්මානනීය, ගෞරවනීය, වන්දනීය
3. ලහිරු, ළමැද, ළපලු, ළදරු
4. ආදර්ශවත්, ආලෝකවත්, ධෛර්යවත්, ආශ්චර්යවත් (.................)

05. අක්ෂර වින්‍යාසය නිවැරදි ව දැක්වෙන පද පේළිය වන්නේ,

1. ප්‍රතිවේදය, ප්‍රථිඵල, ප්‍රතිචීන, ප්‍රතිචාර
2. ශිෂ්ට, නෂ්ට, විශිෂ්ට, දෘෂ්ටි
3. ආස්වාදය, විශ්වය, ස්වසනය, සංගණනය
4. අභ්‍යාසය, සාමර්ථය, යාන්ත්‍රණය. ආරම්භය (.................)

06. නිවැරදි වාක්‍යය තෝරන්න.

1. ඉදිරියෙන් සිසුන් පාර මාරු වේ.
2. අන්තඃපුරය හොරු කඩයි.
3. සියලු ශිෂ්‍යයින් ප්‍රඥාවන්තයින් වේවා.
4. මීයන් වෙණ කතියි දෙමාපියෝ සිතූහ. (.................)

07. නිවැරදි වාක්‍යය තෝරන්න.

1. පොලිස් නිලධාරියා මා නවත්වන ලදී.
2. පොලිස් නිලධාරියා මා නවත්වනු ලබයි.
3. පොලිස් නිලධාරියා විසින් මම නවත්වනු ලැබීමි.
4. පොලිස් නිලධාරියා මම නැවැත්වීය. (.................)

08. උම්මග්ග ජාතකය සිංහලට නැගුණේ,

1. දඹදෙණි අවධියේ දී ය. 2. කුරුණෑගල අවධියේ දී ය.
3. ගම්පළ අවධියේ දී ය. 4. පොළොන්නරු අවධියේ දී ය. (.................)

09. ගුත්තිල කාව්‍යය ලියැවුණේ,

1. කෝට්ටේ අවධියේ ය. 2. මාතර අවධියේ ය.
3. කුරුණෑගල අවධියේ ය. 4. දඹදෙණි අවධියේ ය. (.................)

10. 'තලමල පිපිලා' නාට්‍යය,

1. ස්වතන්ත්‍ර නාට්‍යයකි. 2. පරිවර්තන නාට්‍යයකි.
3. අනුවර්තන නාට්‍යයකි. 4. ප්‍රහසන නාට්‍යයකි. (.................)

11. නව කවි සරණිය සංස්කරණය කළේ,

1. ගුණදාස අමරසේකර 2. විමල් දිසානායක
3. සිරි ගුනසිංහ 4. මහගමසේකර (.................)

CONFIDENTIAL

CONFIDENTIAL

12. "සිදාදියට එන්නට මට බුද්ධිය උඹ තමයි එදා පාර කියා දුන්නේ"
මේ පද්‍ය පාඨයෙහි ඇත්තේ,
1. ව්‍යාංග්‍යාර්ථයකි. 2. වාච්‍යාර්ථයකි.
3. ලක්ෂ්‍යාර්ථයකි. 4. මුඛ්‍යාර්ථයකි. (................)

13. ප්‍රංශ ජාතික ගී ද මෝපසාං ප්‍රසිද්ධ ව ඇත්තේ,
1. නවකතාකරුවකු වශයෙනි. 2. කෙටි කතාකරුවකු වශයෙනි.
3. කවියකු වශයෙනි. 4. නාට්‍යකරුවකු වශයෙනි. (................)

14. හොඳ නවකථාවක අංග ලක්ෂණයක් වන්නේ,
1. යථාර්ථවාදය යි. 2. අද්භූතවාදය යි.
3. සාන්දෘෂ්ටිකවාදය යි. 4. උපයෝගීතාවාදය යි. (................)

15. මනමේ නාට්‍යය,
1. නාට්‍යධර්මී නාට්‍යයකි. 2. ලෝකධර්මී නාට්‍යයකි.
3. ප්‍රහසන නාට්‍යයකි. 4. විකාරරූපී නාට්‍යයකි. (................)

16. 'යසෝදරා වත' යනු,
1. ජන කාව්‍යයකි. 2. විදග්ධ කාව්‍යයකි.
3. ජාතක කථා කාව්‍යයකි. 4. පණ්ඩිතප්‍රිය කාව්‍යයකි. (................)

17. ප්‍රදීපාගාරය යට කෘතියේ කතුවරයා,
1. කේ. ජයතිලක 2. ගුණදාස අමරසේකර
3. රංජිත් ධර්මකීර්ති 4. ජී.බී. සේනානායක (................)

18. සිංහල නව කථාවේ ආරම්භකයා,
1. ඇල්බට් ද සිල්වා 2. ඒ. සයිමන් ද සිල්වා
3. පියදාස සිරිසේන 4. හේමපාල මුනිදාස (................)

19. සිංහල යථාර්ථවාදී නව කථාවේ ආරම්භකයා,
1. මාර්ටින් වික්‍රමසිංහ 2. කේ. ජයතිලක
3. එදිරිවීර සරච්චන්ද්‍ර 4. ගුණදාස අමරසේකර (................)

20. හෙළ හවුලේ නිර්මාතෘ,
1. අරීසෙන් අහුබුදු 2. අලව්ඉසිසැබිහෙළ
3. ආ.දො. චන්ද්‍රසේකර 4. කුමාරතුංග මුනිදාස (................)

(ලකුණු 02 x 20 = ලකුණු 40)

© [සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைகள் துறை
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

CONFIDENTIAL

## අධ්‍යාපනවේදී (විශේෂ) උපාධිය (2017 - 2021)
## කොටස I - 2020 (පෙරහුරු පරීක්ෂණය)
## BH 0151 - පළමු බස (සිංහල)

### II කොටස

ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

02. (i) ජාතක කථාවක මූලික අංගත්‍රය කවරේ ද? (ලකුණු 03)

(ii) උම්මග්ග ජාතකයේ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥාව පිළිබිඹු වන අවස්ථා **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) උම්මග්ග ජාතකයෙහි බමුණන්ට ගැරහීම සිදුවන අවස්ථා **තුනක්** ලියන්න. (ලකුණු 07)

03. (i) ගුත්තිල කාව්‍යයෙහි කතුවරයා නම් කරන්න. (ලකුණු 03)

(ii) ගුත්තිල කාව්‍යය කතුවරයාගේ සානුකම්පික දෘෂ්ටිය මතුවන සිද්ධියක් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) "මූසිල ගුත්තිල වැනි අය වර්තමානයේ ද සිටිති." මෙය සත්‍ය දැ'යි විමසන්න. (ලකුණු 07)

04. (i) නිසදැස් (නිදහස්) කවියේ ආරම්භකයා කවුද? (ලකුණු 03)

(ii) මහගමසේකර කවියාගේ පද්‍ය පිළිබඳ ඔබේ අදහස් කවරේ ද? (ලකුණු 05)

(iii) නිදහස් කවිය අනෙකුත් කවිවලින් වෙනස් වන්නේ කවර ලක්ෂණයන්ගෙන් ද? (ලකුණු 07)

05. (i) යශෝරාවය යන වචනයෙහි අර්ථය කුමක් ද? (ලකුණු 03)

(ii) යශෝරාවයෙහි වීරසේකරගේ චරිතයෙහි කැපී පෙනෙන අංග ලක්ෂණ **තුනක්** ලියන්න.

(ලකුණු 05)

(iii) බලදේව පරමාදර්ශී චරිතයක් ලෙස හැඳින්විය හැකි දැ'යි පිරික්සන්න. (ලකුණු 07)

අ.පි.බ.

06. (i) 'තලමල පිපිලා' නාට්‍යයෙහි රංග ශෛලීය කුමක් ද? (ලකුණු 03)

(ii) සම්ප්‍රදාය හා නවීකරණය පිළිබඳ ගැටලුව 'තලමල පිපිලා' නාට්‍යයෙන් කෙසේ මතුවේ ද? (ලකුණු 05)

(iii) රම්බරණා ගුරුන්නාන්සේගේ චරිතය කෙරෙහි ප්‍රේක්ෂකයා සානුකම්පිත වන්නේ කවර හේතු නිසා දැ'යි විමසන්න. (ලකුණු 07)

07. (i) කෙටි කතාවේ අංග ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(ii) ප්‍රදීපාගාරය යට කෙටි කතාවෙන් මතුවන දෘෂ්ටිය කෙබඳු ද? (ලකුණු 05)

(iii) රංජිත් ධර්මකීර්තිගේ කෙටි කතාවල වස්තු විෂයය පිළිබඳ කෙටියෙන් විමසන්න. (ලකුණු 07)

********

CONFIDENTIAL